ශ්‍රී ශාක්‍යපුත්‍ර පදනම
Sri Shakyaputhra Foundation
F, පළවෙනි මහල, සම්පත්නුවර, වැලිඔය
F, 1st Floor, Sampathnuwara, Welioya, Sri Lanka
info@srishakyaputhra.org
Landline/Fax: +94 (0) 25 205 2866 | Mobile: +94 (0) 77 457 8791|+94 (0) 77 203 6151|+44 (0) 7846 150811

ශ්‍රී ශාක්‍යපුත්‍ර ශිෂ්‍යත්ධාර අනුග්‍රාහක අයදුම්පත්‍රය

පෞද්ගලික තොරතුරු		
ඔබ ආයතනයක් නියොජනය කරන්නෙ නම් ඊලඟ කාණ්ඩයට යන්න		
සම්පූර්ණ නම:		
උපන් දිනය:	ස්ත්‍රී/පුරුෂ භාවය:	දුරකථන අංකය:
පදිංචි ලිපිනය:		නගරය:
ජනපදය/ප්‍රාන්තය:	රට:	කලාප/තැපැල් කේතය:
විද්‍යුත් ලිපිනය:		
ඔබ ශ්‍රී ශාක්‍යපුත්‍ර පදනමෙන් ලබා දෙන පණිවිඩ ලබාගැනීම පිණිස වෙනත් ලිපිනයක් හෝ දුරකතන අංකයක් හෝ විද්‍යුත් තැපැල් අංකයක් භාවිතා කරන්නේ නම් එය සඳහන් කරන්න:		
ඔබ ශ්‍රී ශාක්‍යපුත්‍ර පදනම ගැන දැනගත්තේ කෙසේද?		

ආයතන/සංවිධානයේ තොරතුරු		
ආයතන/සංවිධානයේ නම:		
අංශ භාර නිලධාරියාගේ නම:		
විද්‍යුත් ලිපිනය:		
රාජකාරී දුරකථන අංකය:	ජංගම දුරකථන අංකය:	ෆැක්ස් අංකය:
ආයතන/සංවිධානයේ ලිපිනය:		නගරය:
ජනපදය/ප්‍රාන්තය:	රට:	කලාප/තැපැල් කේතය:
වෙබ් අඩවිය:		

ඔබගේ අභිමතය

ශිෂ්‍යත්ව කාණ්ඩ

- වාර්ශිකව රු. 18,000 1-9 වසර දක්වා දරු දැරියන් සඳහා
- වාර්ශිකව රු. 36,000 10-11 වසර දරු දැරියන් සඳහා
- වාර්ශිකව රු. 48,000 12-13 වසර දරු දැරියන් සඳහා
- වාර්ශිකව රු. 60,000 විශ්ව විද්‍යාල දරු දැරියන් සඳහා
- වෙනත් මුලු මුදල හෝ කොටසකට දායක විය හැක

ඔබ කොපමණ ශිෂ්‍යාධාර ලබා දීමට බලාපොරොත්තු වෙනවාද?

ඔබ කුමන මට්ටමේ දරුවෙකුට හෝ දරුවන්ට ශිෂ්‍යාධාර ලබා දීම පිණිස තෝරා ගැනීමට බලාපොරොත්තු වන්නේද? උදාහරණ: ඉගෙනුම ලබන වසර, දෙමාපිය අහිමි භාවය, ගැහැණු දරුවෙකුද පිරිමි දරුවෙකුද බව ආදී (ඔබගේ අදහසට ගැලපෙන පරිදි ශිෂ්‍යාධාර ලාභී දරුවෙකු/දැරියක සොයා දීමට අප ශක්ති ප්‍රමාණයෙන් උත්සාහ කරන බව කරුණාවෙන් සලකන්න.)
ඔබගේ පසුබිම් තොරතුරු
වර්තමාන වෘත්තිය:
ඔබ ශ්‍රී ශාක්‍යපුත්‍ර ශිෂ්‍යාධාර අනුග්‍රාහකයෙකු වීමට කැමති කුමන හේතුවක් නිසාද?
ශිෂ්‍යාධාර ලාභී දරුවාට ශිෂ්‍යාධාර ලාබා දීමට අමතරව වසරකට දෙවතාවක් දරුවාට අවශ්‍ය අධ්‍යාපන උපකරණ ලබාදීමට සහ වෙනත් විශේෂ අවශ්‍යතාවන්හිදී, උදාහරණයක් ලෙස විශේෂ විභාග සඳහා දුර යෑමේදී අවශ්‍ය ගමන් වියදම් සහ අනෙකුත් අවශ්‍යතාවන් ලබාදීමට හැකිවේද, සහ ඔබගේ ශිෂ්‍යාධාර ලාභී දරුවා විශේෂ අසනීපයකට ලක් වුවහොත් ඔබට ඒ පිළිබඳව විස්වාස කල හැකි තොරතුරු සහිතව දැනුම් දුන්නෝතින් එවැනි දේවල් සඳහා ඔබට දායකත්වය ලබාදිය හැකිද?
ඔබ හෝ ඔබ ආයතනය සතුව ශිෂ්‍යාධාර ලාභී දරුවන්ට හෝ අප පදනමට ලබා දිය හැකි උපකරණ හෝ උපකාර මොනවාද?
ඔබ හෝ ඔබ ආයතනයට ශිෂ්‍යාධාර ලාභී දරුවන්ට රැකියාවල් හෝ තාවකාලික පුහුණුවන් ලබා දීමට හැකියාවක් තිබේද?
අනුග්‍රාහක පොරොන්දු ප්‍රකාශය
මාගේ දැනුමේ තරමට ඉහත සඳහන් තොරතුරු සත්‍ය සහ නිවැරදි බවටද මම හෝ මම නියෝජනය කරන ආයතනය/සංවිධානය ශිෂ්‍යාධාර අනුග්‍රහයකු ලෙස තෝරාගත්තේ නම් පහත සඳහන් ශ්‍රී ශාක්‍යපුත්‍ර පදනමේ නීතිරීති මාලාවට එකඟවද කටයුතු කරන බවට පොරොන්දු වෙමි. ☐ පදනම සමග එකඟ වන දින වකවානු වලදී එම අනුග්‍රාහක ශිෂ්‍යාධාර මුදල ලබාදෙන බවට ☐ ශිෂ්‍යාධාර ලාභී දරුවන් හෝ එම පවුලේ සාමාජික සාමාජිකාවන් සමඟ ශ්‍රී ශාක්‍යපුත්‍ර පදනමේ අනුදැනුමකින් තොරව කිසිදු සම්බන්ධතාවයක් නොපවත්වන බව ☐ ශ්‍රී ශාක්‍යපුත්‍ර පදනමේ පසු පිටෙහි සඳහන් ශිෂ්‍යාධාර නීතිරීති වලට එකඟ බව ☐ ශිෂ්‍යාධාර ලාභී දරුවාගේ අධ්‍යාපනය අවසන් වනතෙක් හෝ පදනම සමඟ එකඟ වූ කාල පරිච්ඡේදය තෙක් හෝ මූල්‍යමය අනුග්‍රාහක දායකත්වය ලබාදෙන බව
අත්සන
අයදුම්කරුගේ අත්සන: / දිනය:
ආයතනය/සංවිධානය (අදාළ නම්):

ඔබට මේ සම්බන්ධයෙන් තවත් තොරතුරු දැනගැනීමට අවශ්‍ය නම් ශ්‍රී ශාක්‍යපුත්‍ර පදනමේ අනුශාසක පූජ්‍ය ගල්ගමුවේ සන්තබෝධි ස්වාමීන්වහන්සේ පහත සඳහන් දුරකථන අංක වලින් සම්බන්ධ කර ගත හැක.

+94 (0) 77 457 8791|+94 (0) 77 203 6151

එමෙන්ම ශාක්‍යපුත්‍ර ශිෂ්‍යාධාර වැඩසටහනේ ප්‍රධාන සම්බන්ධීකාරක ගයත්‍රි දන්ගම්පොලගේ මැතිණිය පහත සඳහන් දුරකථන අංක වලින් සම්බන්ධ කර ගත හැක.

+44 (0) 78 4615 0811 | gaya.dangampolage@srishakyaputhra.org

එසේත් නොමැති නම් අපගේ ප්‍රධාන කාර්යාලයේ දුරකථන අංකයට කතා කිරීමෙන් හෝ ෆැක්ස් පණිවිඩ මගින් හෝ විද්‍යුත් තැපැල් මගින් හෝ තොරතුරු දැනගැනීමට හැක.

+94 (0) 25 205 2866 | info@srishakyaputhra.org

ඔබ ශ්‍රී ශාක්‍යපුත්‍ර ශිෂ්‍යාධාර වැඩසටහන සමග සම්බන්ධවීම පිළිබඳව අප කෘතඥ වන අතරම මෙම අයදුම්පත අපවෙත ලැබුණු විගසම ඔබට ශිෂ්‍යාධාර ලාභී දරුවෙක් සම්බන්ධ කරලීමට ඉදිරි කටයුතු කරලීම පිණිස අප ශ්‍රී ශාක්‍යපුත්‍ර පදනමේ කාර්යමණ්ඩලයේ නිලධාරියෙකු ඉතාම ඉක්මනින් ඔබ හා සම්බන්ධ වනු ඇත.

F, පළවෙනි මහල, සම්පත්නුවර, වැලිඔය
F, 1st Floor, Sampathnuwara, Welioya, Sri Lanka
info@srishakyaputhra.org
Landline/Fax: +94 (0) 25 205 2866 | Mobile: +94 (0) 77 457 8791|+94 (0) 77 203 6151|+44 (0) 7846 150811

වැඩසටහනේ අභිප්‍රාය

1. ශ්‍රී ශාක්‍යපුත්‍ර ශිෂ්‍යත්වය ප්‍රධානය වන්නේ පාසැල් හෝ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අතර ආර්ථික අපහසුතාවයකට පත්ව සිටින දරුවන් උදෙසාය. අප විශ්වාස කරන ආකාරයට දරුවන් අප ජාතියේ අනාගත පරපුර වන අතර ඔවුන්ගේ අධ්‍යාපනය එහි සාර්ථකත්වය කෙරෙහි බලපානු ඇත. එම නිසා මෙහි ඉලක්කය වන්නේ දරුවන්ගේ අධ්‍යාපන සාර්ථකත්වය සඳහා අඩිතාලමක් වෙමින් උගත්, බුද්ධිමත් නව පරපුරක් බිහිකිරීමයි.
2. මෙම කර්තව්‍යයට සම්බන්ධව වෙමින් අපට දායක්වය දක්වන අය විසින් ශ්‍රී ලංකාව තුළ ආර්ථික අපහසුතා මැද අධ්‍යාපනය ලබන දරුවන්ට පාසැල් අධ්‍යාපනය නිමවන තෙක්ම හෝ උසස් අධ්‍යාපනය නිමවන තෙක්ම දායකත්වය දක්වමින් සමාජය තුළ ස්ථාවර තත්වයක් ඔවුන්ට ලබාදීමය. මුලින්ම මුලතිව් දිස්ත්‍රික්කයේ දරුවන්ගෙන් ආරම්භ කර ඉදිරි වසර වලදී මුලු රටේම දරුවන්ට අවස්ථාව ලබාදීමට අපේක්ෂා කරනු ඇත.

ශිෂ්‍යත්ධාර අනුග්‍රහකයන්ගේ මුල්‍යමය වගකීම සහ ඒ පිලිබඳ විස්තර

1. ශිෂ්‍යත්ව ලබා දීම අවුරුදු කීපයක වැඩසටහනකි. අපගේ බලාපොරොත්තුව මේ දරුවන් ඉගනගැනීමට දක්ෂතාවය මැනවින් පෙන්නුම් කරන්නේ නම් අඛණ්ඩවම ශිෂ්‍යාධාරය ලබා දීමය. එමෙන්ම මෙම ශිෂ්‍යාධාර බාණ්ඩ කීපයකට පවතින බැවින් ඔබ ආරම්භයේදී වසරකට ලබාදෙන ශිෂ්‍යත්ව මුදල අනිත් වසරේදී වැඩිවීමට හැක. උදාහරණයක් ලෙස ඔබට හිමිවන ශිෂ්‍යාධාර ලාභී දරුවා මේ වනවිට ඉගෙනුම ලබන්නේ 9 වසරේ නම් ඔබට මේ වසරට දායකත්වය දැරීමට සිදුවන්නේ මසකට රුපියල් 1,500ක් පමණි. එනමුත් ඊලඟ වසරේදී ඔබට මසකට රුපියල් 3,000 පමණ මුදලක් ලබා දීමට සිදු වේ. එවැනි අවස්තාවන්හිදී ඔබට එය ගැටළුවක් නොවන්නේ නම් ඒ පිළිබඳව අපට මාස 3 කට පමණ පෙර දැනුම් දීමට කාරුණික වන්නේ නම් මැනවි. එමෙන්ම යම් හෙයකින් ඔබට එම වැඩිවන මුදල දරා ගැනීමට අපහසුතාවයක් පවතින්නේ නම් එයද අපට මාස 3 කට පමණ පෙර දැනුම් දීමට කාරුණික වන්නේ නම් මැනවි. එවිට එම වැඩිවන මුදල සඳහා ශිෂ්‍යාධාර ලාභී දරුවාට තවත් අනුග්‍රාහකයෙකු අපට සම්බන්ධ කර දිය හැක.
2. ඔබ අප සමග එකඟ වන පරිදි නියමිත දිනයන්හි ශිෂ්‍යාධාර මුදල් අප ලංකා බැංකු වැලිඔය - සම්පත්නුවර ශාඛාවේ ගිණුම වෙත බැර කිරීමට කාරුණික වන්න. ගිණුම වෙත බැර කරන විට ශ්‍රී ශාක්‍යපුත්‍ර අනුග්‍රාහක අංකය යොදා අප වෙත ලදුපත හෝ නිර්දේශ අංකයක් දැනුම් දීමට කටයුතු කරන්න.
3. යම් හෙයකින් ඔබ ආයතනයක් හෝ සමාගමක් නියෝජනය කරන්නේ නම් මුල්‍යමය කටයුතු සඳහා වගකිව හැකි නිලධාරීවරයෙකු අප හා සම්බන්ධ කිරීමට කාරුණික වන්න.

ශිෂ්‍යත්ධාර ලාභී දරුවන් සම්බන්ධ කර වීම

අප විසින් තෝරාගන්න ලද ශිෂ්‍යාධාර ලබා දීමට සුදුසු දරුවන් ඔබට සම්බන්ධ කරන්නේ අයදුම්පත්‍ර ලැබෙන අනුපිලිවෙල අනුවය.
උදාහරණයක් ලෙස අප තෝරාගෙන ඇත්තේ 15 දෙනෙකු නම් එම දරුවන් අනුග්‍රාහකයන් හා සම්බන්ධ කිරීමේදී අප අනුගමනය කරන්නේ මුලින්ම අප වෙත අයදුම්පත්‍ර එවන 15 දෙනාටය.

අනුග්‍රාහකයෙකු බවට පත්වීම

1. අයදුම්පත සම්පූර්ණ කොට ශ්‍රී ශාක්‍යපුත්‍ර පදනමට ලැබෙන්නට සැලැස්වීම (ඔබ අයදුම්පත පුරවන්නේ අත් අකුරින් නම් කළු හෝ නිල් තීන්ත පමණක් භාවිතා කොට පැහැදිලිව ලිවීමට කාරුණික වන්න).
2. ඉන් අනතුරුව ඔබ අනිවාර්යයෙන්ම ශ්‍රී ශාක්‍යපුත්‍ර පදනමේ නිලධාරියෙකු මුණ ගැසීමෙන් හෝ දුරකථන මාර්ගයෙන් හෝ සම්බන්ධ වීම
3. ඉන් අනතුරුව ඔබට ශ්‍රී ශාකපුත්‍ර පදනම විසින් ඔබ වෙත ලැබීමට සලස්සවන පොරොන්දු පත්‍රය සහතික කොට අප වෙත ලබා දීමට සැලැස්විය යුතුය.
4. ඔබ ශ්‍රී ශාකපුත්‍ර පදනම මගින් සිදුකරන ශිෂ්‍යාධාර ව්‍යාපෘතියෙහි අනුග්‍රාහකයෙකු බවට පත් වූ වග ඔබට පදනමේ ගරු අනුශාසක ස්වාමීන්වහන්සේගේ සහතික කිරීම සහිත ලිපියක් තැපැල් හෝ විද්‍යුත් තැපැල් මාර්ගයෙන් ඔබ වෙත ලැබෙනු ඇත.

ශිෂ්‍යත්ව කාණ්ඩ

ඔබට ශිෂ්‍යාධාර එකකට වැඩි ප්‍රමාණයක් ඔබ ශක්ති ප්‍රමාණයට අනුව ප්‍රධානය කිරීමට නිදහස ඇත. අප ශිෂ්‍යාධාර කාණ්ඩ කිහිපයකට වෙන් කර ඇත.

1. වාර්ශිකව රු. 18,000 1-9 වසර දක්වා දරු දැරියන් සඳහා
2. වාර්ශිකව රු. 36,000 10-11 වසර දරු දැරියන් සඳහා
3. වාර්ශිකව රු 48,000 12-13 වසර දරු දැරියන් සඳහා
4. වාර්ශිකව රු. 60,000 විශ්ව විද්‍යාල දරු දැරියන් සඳහා
5. වෙනත්: එක අනුග්‍රාහකයෙකුට මුලු මුදල හෝ කොටසකට දායක විය හැක

අනුග්‍රාකයන් සඳහා කොන්දේසි

1. අප පදනම මගින් ඔබ සම්බන්ධව විමසීමක් සිදුකරන අතරම එයට ඔබ විරුද්ධ නොවිය යුතුය.
2. ඔබ විසින් කිසිසේත්ම පදනමේ අවසරයකින් තොරව කිසිලෙසකින් ශිෂ්‍යාධාර ලාභියා හෝ එම දරුවන්ගේ භාරකරුවන් සමඟ කිසිදු සබඳතාවයක් ඇති කර නොගත යුතුය.
3. ඔබ අප සමඟ ඇති කර ගන්නා ගිවිසුම් වලට අනුකූලවම මුල්‍යමය කටයුතු සිදුකරලීම පිණිස පොරොන්දු විය යුතුය.

ශිෂ්‍යාධාර ලාභී දරුවෙකු වීමට සුදුසුකම්

1. ශිෂ්‍යාධාර ලාභී දරුවෙකු වීමට අයදුම් පත්‍රය පුරවන කල්හි පාසල් හෝ විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙහි නිරත විය යුතු අතර වයස අවුරුදු 25කට වඩා අඩුවිය යුතුය.
2. අඩු ආදායම් ලාභී පවුලක දරුවෙකු විය යුතුය. ඒ පිළිබඳව අදාළ නිළධාරීන්ගෙන් ලබාගත් ලිපි ලේඛන ඉදිරිපත් කල යුතුය. වකුගඩු රෝගවලින් පෙලෙන පවුල් වල දරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
3. ඉගැනුමට දක්වන දක්ෂතාවය අඛණ්ඩව පවත්වා ගත යුතුය.
4. මුලනිවු දිස්ත්‍රික්කයේ පදිංචි කරුවන් විය යුතුය. වැලිඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
5. නිවැරදි අධ්‍යාපන ප්‍රතිඵල ලේඛන අප වෙත ඉදිරිපත් කල යුතුය (සාමාන්‍ය පෙළ සහතික පත්‍ර, උසස් පෙළ සහතික පත්‍ර).
6. දරුවාගේ සහතික කරන ලද උප්පැන්න සහතිකය ඉදිරිපත් කල යුතුය.
7. පදනමේ නීති රීති වලට එකඟ විය යුතුය.

ශිෂ්‍යාධාර ලාභී දරුවෙකු බවට පත්වන ආකාරය

1. අයදුම්පත්‍රය සම්පූර්ණ කොට කලින් සඳහන් කල ලිපි ලේඛනද සමඟ අපවෙත ලබා දීමෙන් අනතුරුව ශ්‍රී ශාක්‍යපුත්‍ර කමිටුව මගින් එම ලිපි ලේඛන පරීක්ෂා කොට පසු විපරීමක් කිරීමෙන් අනතුරුව සම්මුඛ සාකච්ඡා දෙකකට දරුවාව සහ භාරකරුවන් ලක් කොට එම පරීක්ෂණයන්ගෙන් සමත් වුවහොතින් ශිෂ්‍යාධාරය ලබා දේ. එහිදී කිසියම් අගතියකින් තොරව සුදුසුකම් ලාභී දරුවන් පමණක්ම තෝරා ගැනීම සිදු කරයි.
2. ශිෂ්‍යාධාර ලාභී දරුවෙක් බව සනාථ කිරීම පිණිස පදනමේ අනුශාසක ස්වාමීන්වහන්සේගේ අත්සන සහිතව ලිපියක් දරුවාට ලබා දේ.
3. මසකම අවසන් සතියේ ප්‍රධාන කාර්යාලට පැමිණ තමන්ට හිමි ශිෂ්‍යාධාරය ලබාගත හැක. එහිදී පදනම මගින් ලබාදෙන ශිෂ්‍යාධාර ලබාදුන් බව සඳහන් රිසිට් පත අත්සන් කොට ලබා ගැනීම අනිවාර්ය වේ.

ශිෂ්‍යාධාරය අහෝසි වීම

පහත සඳහන් කරුණු වලදී ශිෂ්‍යාධාරය අහෝසි කිරීම පදනම මගින් සිදුකරයි.

1. පදනම වෙත අසත්‍ය තොරතුරු ලබා දීම හෝ සත්‍ය තොරතුරු සඟවාගෙන සිටීම.
2. පාසල් හෝ උසස් අධ්‍යාපන ගමන නතර වීම.
3. ආර්ථික මට්ටම ඉහළ යෑම. (සෑම වසරකම අඩු ආදායම් ලාභී සහතිකය පදනමට ලබා දිය යුතුය.)
4. දරුවාගේ අධ්‍යාපන මට්ටම අඛණ්ඩව වාර තුනකදීම පහළ වැටීම. (සෑම වාරයකම ප්‍රගති වාර්තා සහ උසස් අධ්‍යාපන ප්‍රතිඵල ලේඛන පදනමට පෙන්විය යුතුය.)
5. පදනම විසින් ඉල්ලුම් කරන ලද ලිපි ලේඛන ලබා නොදීම.
6. පදනමේ අනුදැනුමකින් තොරව අනුග්‍රාහකයන් හා සම්බන්ධ වීම.
7. දැනුම් දීමකින් තොරව අඛණ්ඩව වාර තුනක් ශිෂ්‍යාධාර ලබාගැනීමට නොපැමිණීම.
8. ශිෂ්‍යාධාර ලාභී දරුවන් විනය විරෝධී කටයුත්තකට සම්බන්ධ වූ බවට සනාථ වීම.